**බදුල්ල අධ්‍යාපන කලාපය**

# සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය. 2018

## 11 ශ්‍රේණිය

## පද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන.

නම:-........................................................................................................................ කාලය පැය :- 02යි.

පාසල ........................................................................ පාසල් වර්ගය :-200අඩු /201-500 තෙක් / 501 ට වැඩි

( 1 ) කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

01. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

**වතින් සොමි සඳ වූ**
**රන්ලිය සිරින් බඳ වූ**
**නෙනෙත් රන් පෙඳ වූ**
**දියණියන් තම ළඟට කැඳවූ**

i. ඉහත කවිය අයත් පද්‍ය පන්තියේ රචකයා කවුද?
ii. මෙම කවිය තුළින් උද්දීපනය වන කාව්‍යාලංකාරය කුමක්ද ?
iii. මෙම කවියේ එක් එක් පේළියේ අඩංගු මාත්‍රා ගණන වෙන වෙනම දක්වන්න
iv. මෙහි එන තරුණියගේ ශරීරය උපමාකර ඇත්තේ කුමකට ද?
v. මෙම කවියේ එළිසමය රැක ඇත්තෙ කිනම් ස්ථානයකද?

ලකුණු 10 යි

02. පහත කවිල ඉතිරි පද සම්පූර්ණ කරන්න

i. ඉර පායා ඉර අවරට ගියාදෝ
සඳ පායා සඳ අවරට ගියාදෝ
..............................................................
..............................................................

ii. ..............................................................
..............................................................
වයන එවෙණ නද ලොබම කළෝයා
එදින වෛර සීත සිහි නොකළෝයා

iii. සාර පලය අඹ දඹ රඹද වල් පිට
මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට
..............................................................
..............................................................

ලකුණු 10 යි

03. පහත සඳහන් පැන කවි වලට එම විරිතෙන්ම පිළිතුරු කවිය ලියන්න.

I.
අන්සතු දේවල් ඇගයුම් නොකරව්
තමසතු දේවල් ඉහළින් සලකව්
කම්මුතු යැයි කිසිවිටකදි නොසිතව්
මින්මතු පෙරටම තැබූ පය තබවව්

II.
මිහිපිට ඇත්තේ
කොළ පැහැ ගත්තේ
ගවයින් නැත්තේ
සරුවට ඇත්තේ

III.
නිවසේ දෙවියන් කවුදැයි වන්නේ
දියුණේ ප්‍රගමන කිමද කියන්නේ
ඉටුදෙව් පිදුමට ඇයි මැළිවන්නේ
කුමටද තව තව සිතින් තැවෙන්නේ

ලකුණු 10 යි

04. පහත කවි පිළිබඳව රසවින්දනයක් ලියන්න.

05.

හබලට ඔබේ සවිබල අත් රිදෙනවද
ඔරුකඳ උඩින් දළ රළපෙළ නගිනවද
සීතල සුළඟ රළුවට ඇග වැදෙනවද
හිමියනි වෙහෙස නිදිමත දෙක දැනෙනවද

එළියක් පෙනෙන විට හිමියනි වෙරළ බඩ
නැතහොත් දැනෙන විට ඔරුවක් ඇදෙන හඩ
දෙසවන වැටෙන විට කිසිවෙකු නගන හඬ
මා නොදැනුවත්වම මම මගේ දෙපය උඩ

( 2) කොටස

(අ ) පහත දැක්වෙන චිත්‍රය බලා කවි 05කට නොඅඩු 10 කට නොවැඩි පදා නිර්මාණයක් කරන්න.

